**ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2017 වර්ෂය**

---

2017 අංක 32 දරන විසර්ජන (සංශෝධන) පනතින් සංශෝධිත 2016 අංක 24 දරන විසර්ජන පනතේ පළමුවන උපලේඛනයේ හා තෙවන උපලේඛනයේ සඳහන් ශීර්ෂය හා විෂය අංකය යටතේ වන විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය, ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුව විසින් විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම ගිණුමෙන් හා සැසඳුම් ප්‍රකාශයෙන් නිරූපනය වන මූල්‍ය හා භෞතික කාර්යසාධනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව ප්‍රකාරව විගණනය කරන ලදී.

## 1.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ මූල්‍ය කළමනාකරණය හා ගිණුම් කටයුතුභාවය පිළිබඳ වගකීම

---

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 124 ප්‍රකාරව රාජ්‍ය මුදල් ඉපැයීම සහ රජයට ලැබිය යුතු මුදල් එකතු කිරීම මෙන්ම රජයේ සියළුම මුදල් කටයුතු අධීක්ෂණය පිළිබඳ පොදු අවේක්ෂණයද මුදල් අමාත්‍යවරයා වෙත පැවැරී ඇත. මුදල් අමාත්‍යවරයා විසින් එම වගකීම ඉටු කිරීම පිණිස මුදල් රෙගුලාසි 124(2) ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් පත් කර ඇත. මුදල් රෙගුලාසි 125(1)(අ) ප්‍රකාරව දෙපාර්තමේන්තු ප්‍රධානියා තම දෙපාර්තමේන්තුවේ සියළු මුදල් ගනුදෙනු පිළිබඳව ගණන්දීමේ නිලධාරීයා වන අතර ආදායම් ගණන්දීමේ නිලධාරියා භාණ්ඩාගාරය විසින් පත්කර ඇත. පාර්ලිමේන්තුව විසින් පනවන ලද සීමාවන් ඇතුළත තම කාර්යභාරයන් ඉටු කර ඉදිරිපත් කරනු ලබන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රජයේ මුදල් රෙගුලාසි හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට ආදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන විෂය පථය

---

ශීර්ෂය 234 - ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය හා භෞතික කාර්යසාධනය සම්බන්ධයෙන් සැලැසුම් කිරීම, රාජ්‍ය වියදම්, මානව හා භෞතික සම්පත් කළමනාකරණය, අභ්‍යන්තර පාලන විධිවිධාන යොදා ගැනිම, නීති,රීති හා රෙගුලාසිවලට අනුකූලවීම හා පොත්පත්, ලේඛන, වාර්තා හා සැසඳුම් ප්‍රකාශන යාවත්කාලීන කර පවත්වා ගැනීම, ගිණුම් පිළියෙල කර කාලීනව ඉදිරිපත් කිරිම, කාර්යසාධන දර්ශක පදනම් කරගෙන අදාළ පාර්ශවයන් වෙත කාර්යසාධන වාර්තා නිකුත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2018 ඔක්තෝබර් 22 දින දෙපාර්තමේන්තුවේ රෙජිස්ට්‍රාර්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශ පිළිබඳ විගණන

නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද සැලැසුම්, ගිණුම්, සැසඳුම් ප්‍රකාශ හා කාර්යසාධන වාර්තා පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.4 විගණන නිරීක්ෂණය

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රේෂ්ඨාධිකරණ රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ සිදු කරන ලද විගණනයේදී අනාවරණය වූ විගණන නිරීක්ෂණ ඉහත 1.3 ඡේදයේ සඳහන් කර ඇති කළමනාකරණ විගණන වාර්තාවේ විස්තරාත්මකව දක්වා ඇත. එම නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ මෙම වාර්තාවේ 2.1 ඡේදයේ සිට 2.8 දක්වා ඡේදවල සඳහන් කර ඇත. මූල්‍ය පරිපාලනයේ ප්‍රමාණවත් බව තහවුරු වන පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 128 හි සඳහන් විධිවිධාන ඉටුකිරීමේදී අනාවරණය වූ පහත සඳහන් සටහනේ සාරාංශගත කර දක්වා ඇති විගණන නිරීක්ෂණවලට යටත්ව ගණන්දීමේ නිලධාරී වශයෙන් තම ගිණුම් කටයුතුභාවය සතුටුදායක ලෙස ඉටු තිබුණු බව නිරීක්ෂණය විය.

| **මුදල් රෙගුලාසි 128(1) - ගණන්දීමේ නිලධාරීගේ ගිණුම් කටයුතුභාවය** | | ගණන්දීමේ නිලධාරී විසින් එම විධිවිධානවලට අනුගත වී නොතිබීම | නිරීක්ෂණ ඇතුළත් වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|---|
| **මුදල් රෙගුලාසිය** | | | |
| 128(1)(අ) | රජය විසින් නියමකර දක්වා ඇති ප්‍රතිපත්තිය හා බලය දෙනු ලැබූ කටයුතු සඳහා මූල්‍ය ප්‍රතිපාදන සලසා දීමෙහිලා පාර්ලිමේන්තුවේ අභියෝගයන් ගැන සැලකිල්ලට ගෙන තම දෙපාර්තමේන්තුවේ කටයුතු විචක්ෂණ භාවයෙන් යුක්තව සැලැසුම් කර ක්‍රියාත්මක කරන බව සහ ප්‍රස්තුත වර්ෂය සඳහා නියමිත වැඩසටහන සම්පූර්ණ කිරීමට සහ/හෝ නියමිත ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට පරිශ්‍රමයක් දක්වා තිබුණු බව, | 1. ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.<br>2. ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම<br>3. අධි ප්‍රතිපාදන සලසා තිබීම<br>4. කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ ඌනතා | 2.1<br>2.4(අ)<br>2.4(ආ)<br>2.8 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ඇ) | මුදල් රෙගුලාසි හා රජයේ වෙනත් පරිපූරක නියමයන් තම දෙපාර්තමේන්තුවේදී පිළිපදිනු ලබන බවට හා අවශ්‍ය අවස්ථාවලදී ඒවාට අතිරේක වශයෙන් දෙපාර්තමේන්තු නියමයන් නිකුත් කරන බව, | විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් පැවැත්වීමේ අඩුපාඩු | 2.7 |
| 128(1)(ඉ) | රජය සතු වූ හෝ රජයේ භාරයේ පවත්නා මුදල් බඩුබාහිර උපකරණ හා වෙනත් වත්කම් සුරක්ෂිතව තබා ගැනීම සහ සංරක්ෂණය සඳහා ප්‍රමාණවත් තරම් සහ විධිමත් විධිවිධාන යොදවනු ලබන බව, ඒවා වරින්වර සත්‍යාක්ෂණය කරනු ලබන බවටත්, ඒවා නිසියාකාරව නිෂ්කාශණය කරනු ලබන කල්හි එසේ නිෂ්කාශණය කිරීම නියමිත රෙගුලාසිවලට හා උපදෙස්වලට අනුකූලව කරනු ලබන බව, | වත්කම් ලේඛනගත කිරීමේ අඩුපාඩු | 2.3 |
| 128(1)(ඌ) | හිඟව තිබෙන ගාස්තු යනාදිය අයකර ගැනිමට විශේෂ විධිවිධාන යොදන බවට සහ එම කාර්ය පැවැරී ඇති නිලධාරීන් විසින් හිඟ මුදල් පිළිබඳව ඒවා අයකර ගැනීම කඩිනම් කිරීමට ගනු ලැබූ පියවර පිළිබඳව යටත් පිරිසෙන් තුන් මාසයකට වරක් හෝ අන්‍යාකාරයකින් විධානය කළ පරිදි හෝ තමා වෙත වාරතා කරන බව, | රජයේ නිලධාරීන්ගේ හිඟහිටි අත්තිකාරම් ණය අය කර ගැනීමට අපොහොසත්වීම | 2.5(අ) |
| 128(1)(එ) | රජයේ කටයුතු ඉටු කිරීමේදී අපේක්ෂිත අරපිරිමැස්ම, කාර්යක්ෂමතාව, විධිමත්බව හා අවංකභාවය යන කරුණු පිළිබඳ නිසි සැලැකිල්ලෙන් යුක්තව තම දෙපාර්තමේන්තුවේ කටයුතු කරගෙන යන බව | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිවීම් | 2.2 |

| | | | |
|---|---|---|---|
| 128(1)(ජ) | නිලධාරීන්ගේ/සේවකයින්ගේ ප්‍රමාදය, නොසැලැකිල්ල, වරද හෝ වංචාව නිසා රජයට පාඩු සිදු වී ඇති අවස්ථාවලදී මුදල් රෙගුලාසි 103 සිට 108 දක්වා රෙගුලාසිවල නියම කර ඇති කාර්ය පරිපාටිය ගණන්දීමේ නිලධාරීන් විසින් අනුගමනය කරනු ලබන බවටද, මුදල් රෙගුලාසි 156(1) අනුව එම පාඩු සම්බන්ධයෙන් වගකිව යුතු නිලධාරීන්/සේවකයන් මත අධිභාර පනවනු ලබන බව | බැංකුගත කර නොතිබුණු මුදල් වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර නොතිබීම | 2.6(ආ) |

## 2. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ

------------------------------------------------

### 2.1 සැලැසුම් කිරිම

----------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2017 වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 2.2 සැපයුම් හා සේවා ඉටුකිරිම

------------------------------

සමාලෝචිත වර්ෂයේදී දෙපාර්තමේන්තුව විසින් එකතුව රු.මිලියන 10.16 ක් වටිනා පරිගණක යන්ත්‍ර 05 ක් හා ටැබ් පරිගණක 25 ක් අවස්ථා 05 කදී මිලදී ගෙන තිබුණි. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.1 මාර්ගෝපදේශය ප්‍රකාරව සවිස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 හා 6.3.6 මාර්ගෝපදේශ ප්‍රකාරව වෙළඳපොල මිල සැදැහුම් ක්‍රමය යටතේ සිදු කරනු ලබන ප්‍රසම්පාදනයන් සම්බන්ධයෙන් වූ ලංසු ප්‍රසිද්ධියේ විවෘත කර නියමිත ආකෘතියේ වාර්තා කර නොතිබුණි.

(ඇ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.11.1 මාර්ගෝපදේශය ප්‍රකාරව ලංසු ඇගැයීම අවසන් කළ වහාම තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් ලංසු ඇගැයීමේ වාර්තාවක් පිළියෙල කර සියළු සනාථ කිරීමේ ලේඛන සමඟ එම වාර්තාව ප්‍රසම්පාදන කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, තාක්ෂණික ඇගැයීම් කමිටුව විසින් එසේ සිදු කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 8.9.1(ආ) මාර්ගෝපදේශයට පටහැනිව විධිමත්ව කොන්ත්‍රාත් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

(ඉ) මිලදී ගෙන තිබුණු පරිගණක හා උපාංග 2002 නොවැම්බර් 28 දිනැති අංක 1AI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛ ප්‍රකාරව පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනයේ ඇතුළත් කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.3 මාර්ගෝපදේශය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේදී මිලදී ගැනීමට අපේක්ෂා කළ භාණ්ඩ, ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් කර ප්‍රසම්පාදන කාලසටහන අනුව කටයුතු කර මිලදී ගත යුතුව තිබුණි. නමුත් රු.මිලියන 4.95 ක් වටිනා ටැබ් පරිගණක යන්ත්‍ර 25 ක් මිලදී ගැනීමේ දී ඒ අනුව කටයුතු කර නොතිබුණි.

## 2.3 වත්කම් කළමනාකරණය

-----------------------------

දෙපාර්තමේන්තුවේ වතක්ම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩුව අනාවරණය විය.

**වත්කම් ලේඛනගත කිරිම**

-----------------------------

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන පරිගණක, උපාංග හා මෘදුකාංග පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා තිබුණි. නමුත් එම ලේඛනවල දෙපාර්තමේන්තුවේ සියළුම වත්කම් ඇතුළත් කර නොතිබුණි. 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලයේ වත්කම් කළමනාකරණ චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ වත්කම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රොල් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කර තිබුණි. නමුත් එම තොරතුරු ස්ථාවර වත්කම් ලේඛනවල සඳහන් තොරුතුරු සමඟ එකඟ වී නොතිබුණි. එමෙන්ම වාහන 10 ක්, පිරියත හා යන්ත්‍රෝපකරණ 88 ක් සහ කාර්යාල උපකරණ හා ගෘහ භාණ්ඩ 2382 වශයෙන් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත තොරතුරු ඉදිරිපත් කර තිබුණු අතර, ඒවායේ වටිනාකම තක්සේරු කර වාර්තාවේ සඳහන් කර නොතිබුණි.

## 2.4 කාර්යභාරයන් ඉටු කිරිම සඳහා පාර්ලිමේන්තුව විසින් සලසා තිබුණු ප්‍රතිපාදනය උපයෝජනය කිරිම

------------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සලසා තිබුණු ප්‍රතිපාදනය, උපයෝජනය හා ඉතිරිය පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| වර්ෂය | වියදම් වර්ගය | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| 2016 | පුනරාවර්තන | 152.9 | 143.1 | 9.8 | 6.41 |
| | මූලධන | 9.4 | 4.6 | 4.8 | 51.06 |
| | **එකතුව** | **162.3** | **147.7** | **14.6** | **9.00** |
| 2017 | පුනරාවර්තන | 160.9 | 147.8 | 13.1 | 8.14 |
| | මූලධන | 11.7 | 9.4 | 2.3 | 19.66 |
| | **එකතුව** | **172.6** | **157.2** | **15.4** | **8.92** |

**මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) **ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම**

වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.65,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් කිසිදු උපයෝජනයක් නොකිරීම නිසා එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි කර තිබුණි.

(ආ) **අධි ප්‍රතිපාදන සලසා තිබීම**

වැය විෂයයන් 10 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම නිසා එම ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් සියයට 21 ක සිට සියයට 89 ක් දක්වා ප්‍රමාණවලින් ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි.

(ඇ) ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම

වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු ඉතිරිය ඉක්මවා රු.317,111 ක බැරකම්වලට එළඹ තිබුණි.

## 2.5 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්

දෙපාර්තමේන්තුවට අදාල විෂය අංක 23401 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
| --- | --- | --- | --- | --- | --- |
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 16.00 | 15.98 | 10.00 | 12.32 | 40.00 | 36.80 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව 2017 දෙසැම්බර් 31 දින වන විට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව ස්ථාන මාරුවී ගිය නිලධාරීන්ගේ ණය ශේෂ හැර රු.138,312 ක් වී තිබුණි. එම හිඟහිටි ශේෂ මාස 06 ක සිට ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනිමට දෙපාර්තමේන්තුව අපොහොසත් වි තිබුණි.

(ආ) දෙපාර්තමේන්තු පොත් අනුව රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පාලන ගිණුමේ ශේෂය හා භාණ්ඩාගාර පොත් අනුව එම ශේෂය අතර රු.65,245 ක වෙනසක් පැවතුණි. එම ශේෂය 2012 වර්ෂයේ සිට පැවත එමින් තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසන් වන විටත්, මුදල් රෙගුලාසි 427 ප්‍රකාරව සැසඳීම් කර නිවැරදි කර නොතිබුණි.

## 2.6 බැංකු ගිණුම් මෙහෙය වීමේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බැංකු ජංගම ගිණුමේ 2017 දෙසැම්බර් 31 දිනට නිකුත් කර තිබුණත්, බැංකුව වෙත ඉදිරිපත් නොවූ මාස 06 කට වැඩි කල් ඉකුත් වු රු.5,000 ක් වටිනා චෙක්පතක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 396(ඈ) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 දෙසැම්බර් 31 දිනට බැංකු සැසඳුම් ප්‍රකාශයේ දැක්වෙන වර්ෂයකට අධික කාලයක් මුළුල්ලේ බැංකු ගත කර නොතිබුණු රු.48,978 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104(1) ප්‍රකාරව කටයුතු කර ඌනතාවයට සම්බන්ධ වගකිව යුතු නිලධාරීන්ගෙන් අය කර ගැනීමට 2018 අගෝස්තු මාසය වන විටත් දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 2.7 විගණන හා කළමනාකරණ කමිටුව

අධිකරණ අමාත්‍යාංශයේ විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර තිබුණද, 2016 ජනවාරි 28 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයෙන්

සංශෝධිත 2009 ජුනි 09 දිනැති අංක DMA/2009(1)(i) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව වර්ෂයක් තුළ කාර්තුවකට එක් වරක් බැගින් විගණන හා කළමනාකරණ කමිටුවේ රැස්වීම් වාර 04 ක් පැවැත්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී කමිටුවේ රැස්වීම් වාර 02 ක් පමණක් පවත්වා තිබුණි.

## 2.8 මානව සම්පත් කළමනාකරණය

**අනුයුක්ත කාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම**

2017 දෙසැම්බර් 31 දිනට අනුමත, තථ්‍ය, පුරප්පාඩු හා අතිරික්ත කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ. සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රේෂ්ඨාධිකරණ පරිපාලනයේ පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු. මිලියන 85.78 ක්ද වැය කර තිබුණි. අභියාචනාධිකරණයේ පරිපාලනය වෙනුවෙන් රු.මිලියන 50.89 ක්ද වැය කර තිබුණි.

**ශ්‍රේෂ්ඨාධිකරණ පරිපාලනය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 05 | 06 | 01 | 02 |
| (ii) | තෘතියික මට්ටම | 13 | 10 | 05 | 02 |
| (iii) | ද්විතියික මට්ටම | 111 | 75 | 42 | 06 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 103 | 89 | 18 | 04 |
| (v) | අනියම්/කොන්ත්‍රාත් | - | 02 | - | 02 |
| | **එකතුව** | **232** | **182** | **66** | **16** |

**අභියාචනාධිකරණයේ පරිපාලනය**

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 01 | 02 | - |
| (ii) | තෘතියික මට්ටම | 18 | 09 | 09 | - |
| (iii) | ද්විතියික මට්ටම | 49 | 54 | - | 05 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 45 | 43 | 02 | - |
| | **එකතුව** | **115** | **107** | **13** | **05** |
| | **මුළු එකතුව** | **347** | **289** | **79** | **21** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

2017 වර්ෂයේදී දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් 181 දෙනෙකුගෙන් නිලධාරීන් 138 දෙනෙකුට කිසිම ආකාරයේ පුහුණුවක් ලබා දී නොතිබුණි.